# <u>වැලිගෙපොල ප්‍රාදේශීය සභාව</u>

## <u>2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියා පදිංචි කිරීම.</u>

මෙහි සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා සැපයුම්කරුවන් ද ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් ද ලියාපදිංචි කිරීම පිණිස මා විසින් 2022.12.31 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

02.අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරේ "සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2023" යනුවෙන් පැහැදිලිව සටහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

03.අයදුම්පත් එවීමේදී ඒ සමඟ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්ද ඉදිරිපත් කළ යුතුය.

04.ලියාපදිංචි කිරීමේ ගාස්තු ලේකම්, වැලිගෙපොල ප්‍රාදේශීය සභාව යන නමට ලියනු ලබන චෙක්පත්/මුදල් ඇනවුම් හුණුවල, ඕපනායක යන ලිපිනයට එවිය යුතුය. මුදලින් ගෙවන්නේ නම් අතින් ගෙනැවිත් භාර දිය හැක. පහත දක්වා ඇති ආකෘතියට අනුව තමන් විසින් සකස් කරන ලද අයදුම්පතක් සහ අදාල සහතික වල පිටපත් (සියලු විස්තර සහිතව) අමුණා එවිය යුතුය.

**01.ද්‍රව්‍ය සැපයීම (එක් අයිතමයක් සඳහා රු.1000.00 අය කරනු ලැබේ)**

01.කාර්යාල ලිපි ද්‍රව්‍ය, පාරිභෝගික භාණ්ඩ, සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම.

02.කාර්යාල යන්ත්‍ර සූත්‍ර, යතුරු ලියන, ඡායා පිටපත් යන්ත්‍ර.

03.කාර්යාලයීය වානේ භාණ්ඩ/ ලී බඩු උපකරණ සැපයීම.

04.පරිගණක යන්ත්‍ර (ආනයනික) හා පරිගණක උපාංග.

05.ඉදිකිරීම් ද්‍රව්‍ය (සිමෙන්ති, කොන්ක්‍රීට් භාණ්ඩ අන්තර් සම්බන්ධිත කුට්ටි ගල්, යකඩ, හුණු, ටයිල්, තීන්ත) ආදිය.

06.ඉදිකිරීම් ද්‍රව්‍ය (ගල්, මැටල්, වැලි, ගඩොල්, බ්ලොක් ගල්, දැව, තාර, කෝලාස්) ආදිය.

07.වාහන සඳහා ටයර් ,ටියුබ් හා බැටරි සැපයීම.

08.රබර් සීල්, දින මුද්‍රා හි නිම පුවරු සැපයීම/සැකසීම.

09.කාර්යාලීය මුද්‍රණ කටයුතු කර සැපයීම.

10.පී.වී.සී./ජී.අයි./නල වර්ග හා උපාංග සැපයීම.

11.ජල මනු (මීටර්) සැපයීම.

12.පුස්තකාල පොත්

13.වාහන තහඩු හා වරිපනම් තහඩු සැපයීම.

14.සියලුම වර්ගයේ රථ වාහන අමතර කොටස් සැපයීම.

15.හියුම් පයිප්ප, ළිං කටවල් ,කම්බි කණු සැපයීම.

16.රෙදි පිලි, කාර්යාල තිර රෙදි, කොකු වර්ග හා උපාංග සැපයීම.

17.සෞඛ්‍ය උපකරණ, කම්කරු මෙවලම් හා පිරිසිදු කිරීමේ උපකරණ.

18.පෙර පාසල් උපකරණ, ඩෙස්ක්, පුටු, බංකු.

19.ඉදි කිරීම් කටයුතු සඳහා (ලොරි, ට්‍රැක්ටර්, ඩෝසර්, ලෝඩර්, රෝපර් යන්ත්‍ර) ආදිය.

20.ආහාර පාන හා සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය උපාංග.

21.කාර්යාලීය බෑග් හා සම්භාණ්ඩ සැපයීම.

22.වීදි පහන් උපකරණ හා ඉලෙක්ට්‍රිකල් උපකරණ සැපයීම.

**02.සේවාවන් (එක් අයිතමයන් සඳහා රු.1000.00 අය කරනු ලැබේ.)**

01.මෝටර් රථ කුෂන් වැඩ හා හුඩ් වැඩ.

02.මෝටර් රථ අලුත් වැඩියා කිරීම.

03.වාහන සේවා (සර්විස්) කිරීම.

04.කාර්යාලීය යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවි කිරීම.

05.ලියවන පට්ටල් වැඩ, වැල්ඩින් වැඩ, හයිඩ්‍රොලික් හෝස් අලුත්වැඩියා කිරීම.

06.ගිණි නිවන උපකරණ සවි කිරීම හා නඩත්තුව.

07.විදුලිය සම්බන්ධ සේවා සැපයීම.

08.CCTV සවි කිරීම හා නඩත්තු කටයුතු.

**03.කොන්ත්‍රාත්කරුවන් (එක් අයිතමයක් සඳහා රු.1000.00 අය කරනු ලැබේ)**

01.රු.100,000/= දක්වා ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ලියාපදිංචි සුදුසුකම් ලත් එක් සමිතියක් වෙනුවෙන්.

02..100,001 /= සිට 500,000/= දක්වා සභා බල ප්‍රදේශයේ ලියාපදිංචි සුදුසුකම් ලත් එක් සමිතියක් වෙනුවෙන්.

03.500,001/= සිට ඉහලට  ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ලියාපදිංචි සුදුසුකම් ලත් එක් සමිතියක් වෙනුවෙන්.

(එක් එක් අයිතමයක් වෙනුවෙන් වෙන වෙනම ගාස්තු ගෙවිය යුතුය).

**කොන්දේසි.**

01.ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ සාමාන්‍ය මිල ගණන් කැඳවන අතර ඔවුන් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් අඩු වශයෙන් මාස 03 කාලයක් තුළ වෙනස් නොකර ස්ථාවර තත්වයක තබා ගත යුතුය.

02අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවන්හිදී වෙනත් සැපයුම්කරුවන්ගෙන්, භාණ්ඩ ලබා ගැනීමේ අයිතිය සභාව සතුය.

03.මිල ගණන් ඉල්ලුම් කිරීම්දී ඒවා ඉදිරිපත් නොකරන්නාවූ ද, ඇනවුම් සඳහා නියමිත වේලාවට භාණ්ඩ/සේවා නොසපයන්නාවූ ද සාම්පල් අනුව භාණ්ඩ නොසපයන්නාවූ ද සැපයුම්කරුවන්ගේ නම් කිසි දැනුම් දීමකින් තොරව ලියාපදිංචි ලේඛනයෙන් කපා හැරීමට කටයුතු කරනු ඇත.

04.ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් බාහිරවද කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ අයිතිය සභාව සතුය.

05.කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වන තම සුදුසුකම් තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

2022.10.18.

වැලිගෙපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී,

හුණුවල, ඕපනායක.

කේ.ඕ.කැලුම් ප්‍රියංකර ජයසිංහ,

සභාපති,

වැලිගෙපොල ප්‍රාදේශීය සභාව.

**වැලිගෙපොල ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම**

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :- ..........................................................................................

02. ලිපිනය :- ..........................................................................................

03. හැඳුනුම්පත් අංකය :- ......................................................................

04. ආයතනයේ දුරකථන අංකය, ෆැක්ස් අංකය, ඊ-මේල් ලිපිනය :- ..................................................

..........................................................................................................................................

05. ව්‍යාපාරයේ ස්වභාවය :- ..........................................................................................

06. නිෂ්පාදක ද, එකම අලෙවි නියෝජිත ද, එකම ආනයනකරු ද, එකම බෙදා හරින්නා ද, තොග රැස් කරන්නා ද යනාදී විස්තර :- ..........................................................................................

07. සපයනු ලබන භාණ්ඩ හෝ සේවාව :- ..........................................................................................

08. අයිතම අංකය :- ..........................................................................................

09. ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය :- ......................................................................

ඉක්ටැඩ් ලියාපදිංචි අංකය (පිටපත අමුණන්න)

10. පිරිවැටුම් බදු ලිපි ගොනු අංකය :- ......................................................................

11. දින 30 ක අවම කාලයකට ණය පහසුකම් මත සැපයීම් කිරීමට එකඟ වන්නේ ද යන වග :- .........

12. ණය සීමාව :- ......................................................................

13. වෙනත් :- ......................................................................

14. චෙක්පත් වටිනාකම හා චෙක්පත් අංක :- ..........................................................................................

ඉහත විස්තර සත්‍ය සහ නිවැරදි බැවින්,.......................................................................ආයතනය සැපයුම්කරු / කොන්ත්‍රාත්කරු ලෙස ලියාපදිංචි කර ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

දිනය :- ..........................................

.................................

අයදුම්කරුගේ අත්සන

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ලදුපත් අංකය හා දිනය :- ..................................................

ලියාපදිංචි ලේඛනයේ පිටු අංකය :- ..................................................

දිනය :- ........................................ ............................

විෂය භාර නිලධාරී

අදාල සැපයුම්කරුවා/කොන්ත්‍රාත්කරුවා ලියාපදිංචි කර ගැනීම සඳහා අනුමත කරමි/නොකරමි.

දිනය :- ........................................

..........................

ලේකම්